// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2403/31 - 2024 සැප්තැම්බර් මස 25 වැනි බදාදා - 2024.09.25
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වෛද්‍ය ආඥාපනත යටතේ බලයලත් නිලධාරීන් පත් කිරීම

1987 අංක 30 සහ 1988 අංක 25 දරන සංශෝධිත වෛද්‍ය ආඥාපනතේ 69/A/2 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සෞඛ්‍ය අමාත්‍ය, වෛද්‍ය රමේෂ් පතිරණ වන මම, ඉහත පනතේ අභිමතාර්ථ පරිද්දෙන්, පහත සඳහන් උපලේඛනය ප්‍රකාරව ඔවුන් වෙත පවරන ලද බල ප්‍රදේශයේ සහ සේවා අවශ්‍යතාව අනුව සේවය සලසා ලීමට ඔවුන් පත් කළ හැකි වෙනත් ඕනෑම බල ප්‍රදේශයක බලයලත් නිලධාරීන් වශයෙන් පහත සඳහන් නිලධාරීන් පත් කිරීමට කටයුතු කරන බව මෙම නිවේදනය මගින් දැනුම් දෙමි.

මෙම තනතුරට පත් කරනු ලබන්නේ, පහත උපලේඛනයේ දක්වා ඇති පරිදි ඔවුන්ගේ නිල තත්ත්වය අනුව, සේවයේ යෙදෙන්නා වූ ද, දැනට සේවයේ නියුතුව තනතුරු දරන්නා වූ ද, වෙනත් තනතුරක වැඩ බැලීමෙහි යෙදෙන්නා වූ ද, එවන් තනතුරකට කලින් කලට පත් කරන්නා වූ ද, නිලධාරීන් යනා දී වශයෙන් ය.

නිලධාරියා සේවයෙහි නිරතව සිටින තාක්කල් මෙම තනතුරු සියල්ල වලංගු වන්නේය.

#### උපලේඛනය

| *කාණ්ඩය* | *පවරනු ලබන බල ප්‍රදේශය* |
|---|---|
| වෛද්‍ය නිලධාරී | අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී බල ප්‍රදේශය හෝ කාර්යාලය |
| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශය හෝ කාර්යාලය |

වෛද්‍ය රමේෂ් පතිරණ,
සෞඛ්‍ය අමාත්‍ය.

2024 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

EOG 09 - 0174

1A - PG 6884 — 154 (2024/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*